රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 15/96

මගේ අංකය :-I/543ඊ/01/27
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

1996 ජුනි මස 18 වැනි දින.

සියළුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## <u>රාජ්‍ය අංශයේ දෛනික වැටුප් සංශෝධනය කිරීම.</u>

1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ III වන පරිශිෂ්ඨයේ සඳහන් රාජ්‍ය අංශයේ දෛනික වැටුප් ලබන සේවකයන්ගේ වැටුප් 1995.11.01 දින සිට පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

| | <u>තනතුර</u> | රා.ප.ච.37/92 <u>අනුව වැටුප</u> | සංශෝධිත <u>වැටුප</u> |
|---|---|---|---|
| 01. | ඇස්කිසි නිලධාරි (ජාතික නිවාස) | 72.00 | 87.00 |
| 02. | නවාතැන් බංගලා සහකරු (දුම්රිය) | | |
| | වයස අවු. 16 වැඩි | 44.00 | 53.00 |
| | වයස අවු. 17 වැඩි | 47.00 | 57.00 |
| | වයස අවු. 18 වැඩි | 50.00 | 60.00 |
| 03. | සුළු පරිපාලක I ශ්‍රේණිය | 82.00 | 99.00 |
| | සුළු පරිපාලක II ශ්‍රේණිය | 82.00 | 99.00 |
| 04. | කාර්මික ශ්‍රේණිය | 82.00 | 99.00 |
| 05. | කම්කරු ශ්‍රේණි සේවකයින් | | |
| | I පන්තිය I ශ්‍රේණිය | 82.00 | 99.00 |
| | I පන්තිය II ශ්‍රේණිය | 72.00 | 87.00 |
| | II පන්තිය | 67.00 | 81.00 |
| | III පන්තිය | 63.00 | 76.00 |
| 06. | කාර්යාල කම්කරුවන් (කම්කරු ශ්‍රේණියේ සේවකයන් හැර) | 63.00 | 76.00 |
| 07. | මුරකරුවන් | 67.00 | 81.00 |
| 08. | පණිවුඩකරුවන් | 67.00 | 81.00 |
| 09. | බයිසිකල් පණිවුඩකරුවන් | 67.00 | 81.00 |
| 10. | කාර්යාල කාර්ය සහායකයින් | 67.00 | 81.00 |
| 11. | උද්‍යාන කම්කරු | 63.00 | 76.00 |
| 12. | අමදින්නා | 63.00 | 76.00 |
| 13. | අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරවන්නන් | 69.00 | 83.00 |
| 14. | පොත් බැඳුම්කරු | 69.00 | 83.00 |
| 15. | සනීපාරක්ෂක කම්කරු | 63.00 | 76.00 |

| | | | |
|---|---|---|---|
| 16. | ඖෂධ සංයෝජක | 72.00 | 87.00 |
| 17. | අරක්කැමි | 67.00 | 81.00 |
| 18. | උපස්ථායක | 67.00 | 81.00 |
| 19. | විත්නඹු | 72.00 | 87.00 |
| 20. | දුරකථන ක්‍රියාකරවන්නන් | 69.00 | 83.00 |
| 21. | යතුරු ලේඛකයින් | 72.00 | 87.00 |
| 22. | ලිපිකරුවන් | 72.00 | 87.00 |
| 23. | ලඝු ලේඛක - I පන්තිය | 106.00 | 128.00 |
| 24. | ලඝු ලේඛක - II පන්තිය | 82.00 | 99.00 |
| 25. | මෝටර් රථ රියදුරු | | |
| | I පන්තිය | 82.00 | 99.00 |
| | II පන්තිය "අ" ඛණ්ඩය | 72.00 | 87.00 |
| | II පන්තිය "ආ" ඛණ්ඩය | 69.00 | 83.00 |
| 26. | සැලසුම්කරුවන් | 81.00 | 98.00 |
| 27. | භාෂා පරිවර්තකයන් | 106.00 | 128.00 |
| 28. | භාෂා පරිවර්තක (උපාධිධාරී) (ජීවන වියදම් දීමනා සඳහා හිමිකම් නැත) | 120.00 | 144.00 |

02. මෙම චක්‍රලේඛයේ වැටුප් සංශෝධනය නොසලකා සංයුක්ත දීමනා සඳහා ඇති හිමකම් සහ දුම්රිය බලපත්‍ර සඳහා ඇති හිමිකම 1992.12.24 දිනැති අංක 37/92 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මත පදනම් වනු ඇත.

03. 1996.03.20 දිනැති අංක 09/96 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදයේ සඳහන් දීමනා 1996.01.01 දින සිට ගෙවා ඇත්නම් මෙම චක්‍රලේඛය යටතේ ගෙවීම් කිරීමේදී මුදල් ආපසු අය කළ යුතුය.

04. සංශෝධනය කරන ලද වැටුප් ගෙවිය යුත්තේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට 1996 අයවැය ප්‍රතිපාදන මගින් සලස්වා ඇති පුනරාවර්තන ප්‍රතිපාදන වලිනි. අතිරේක අරමුදල් වන්නේ නම් එවැනි අතිරේක අරමුදල් ප්‍රමාණය ගණන් බලන ලද ආකාරය පැහැදිලි කරමින් ඉල්ලුම් පත්‍රයක් මහා භාණ්ඩාගාරයේ අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් ඉතිරිවීම් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වැය ශීර්ෂවල තිබෙන බව තහවුරු වනතුරු හෝ අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වෙන් කිරීමක් ලබා ගන්නා තුරු හර කිරීම් නොකළ යුතුය. අතිරික්තයක් ආවරණය කර ගැනීම සඳහා අයවැය අධ්‍යක්ෂ ජනරාල් විසින් වෙන් කිරීම් කරනු නොලබන බැව් පැහැදිලිවම සටහන් කර ගත යුතුය.

05. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයේ එකගත්වය ඇතිවය.

අ.කලේ/(ආර්.එස්.ජයරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , වැවිලි කර්මාන්ත හා
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය